# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**නිවාඩු කාලීන පැවරුම්**

**සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය**

# 1 ශ්‍රේණිය - පරිසරය (හතරවන සතිය)

**13 තේමාව - එළිය සමඟ සෙල්ලම්**

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු කියන්න.**

.

1. අඳුර සහ ආලෝකය දෙස බලන්න.එහි වෙනස දෙමව්පියන්ගෙන් අසා දැනගන්න.
2. ආලෝකය ඇති විට පරිසරයේ සහ නිවාස ඇතුළේ සෙවණැලි රූප සාදන්න. අත්දැකීම් ලබාගන්න.
3. දෙමව්පියන් සමග එකතු වීහොදින් හිරු එළිය වැටෙන තැනක කණුවක් සිටුවන්න. විවිධ අවස්ථාවල හිරුගේ පිහිටීම අනුව සෙවනැල්ලේ ප්‍රමාණය වෙනස් වන බව පෙන්වන්න.
4. ආලෝකය වෙනත් තැනකට හරවන්න.හිරු එළියෙන් දේදුන්න හදන්න. කන්නාඩියෙන් හිරු එළිය බිත්තියට අල්ලා බලන්න.දෙමව්පියන්ගේ උදව් ගන්න.
5. මිනිසා විසින් නිර්මාණය කළ ආලෝකය ලබාදෙන උපකරණ වල පින්තූර එකතු කරන්න.( විදුලි පන්දම, ලාම්පු,ඉටිපන්දම්)
6. පවුලේ සාමාජිකයන් සමග එකතු වී සෙවණැලි පාගන්න.විනෝද වන්න.
7. හිරු එළිය ඇති විට ඔබේ අත පා දිගහරිමින්, හකුළුවමින් සෙවණැල්ල නිරීක්ෂණය කරන්න.
8. සෙලොෆෙන් කඩදාසියක් ගෙන අවට නැරඹීමට මිදුලට යන්න. හිරුගේ වටිනාකම අසා දැනගන්න.
9. ගෙවත්තට හිරු එළිය වැටෙන නොවැටෙන තැන නිරීක්ෂණය කරන්න.
10. විවිධ හැඩ සහිත සරල වෙසක් කූඩු දෙමව්පියන් සමග එකතුව සාදන්න. සාලොකමත් කර සතුටු වන්න.